# මැතිවරණ කොමිෂන් සභාව

## ඇබෑර්තු - සහකාර මැතිවරණ කොමසාරිස්

මැතිවරණ කොමිෂන් සභාවේ පුරප්පාඩුව පවතින දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් තනතුරු සඳහා සුදුසු නිලධාරීන් ස්ථාන මාරු කරවා ගැනීම පිණිස අයදුම්පත් කැඳවනු ලැබේ.

*අයදුම්කරුවන් :*

- ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ නිලධාරියකු විය යුතුය.
- තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
- විශිෂ්ඨ චරිතයකින් හෙබිවිය යුතුය.
- වයස අවුරුදු 21 ඉක්ම වූ සහ අවුරුදු 45 ට අඩු විය යුතුය.
- අනුප්‍රාප්තිකයින් රහිතව හෝ අනුප්‍රාප්තිකයකු පසුව ලබාදීමේ පදනම මත නිදහස් කරවා ගැනීමට ආයතන ප්‍රධානීගේ එකඟත්වය තිබිය යුතුය.
- අවම වශයෙන් වසර 4ක කාලයක් මැතිවරණ කොමිෂන් සභාව යටතේ සේවය කිරීමට එකඟ විය යුතුය.
- කිසිදු දේශපාලන පක්ෂයක් සමග හෝ දේශපාලන කටයුතුවල ක්‍රියාකාරීව යෙදෙන අයෙකු නොවිය යුතු අතර ආයතන සංග්‍රහයේ XXXII පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතුය.

අයදුම්පත් තම ජීව දත්ත තොරතුරු ද සමග ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව 2026.08.21 දින හෝ ඊට පෙර මැතිවරණ කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු අතර අයදුම්පත එවනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ **"සහකාර මැතිවරණ කොමසාරිස් තනතුරු පුරප්පාඩු පිරවීම"** යනුවෙන් සඳහන් කළ යුතුය.

**එච්.එම්.ටී.ඩී.හේරත්,**
ලේකම්,
මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.